# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1490 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 30/11/2023<br>පැය 1925 |

## මාධ්‍ය නිවේදනය

### ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා වැඩබලන පොලිස්පති ලෙස රාජකාරි භාර ගැනීම.






ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා 2023.11.30 වන අද දින උදෑසන සුබ මොහොතින් සර්ව ආගමික වතාවත් මධ්‍යයේ පොලිස් මූලස්ථානයේදී වැඩබලන පොලිස්පති ලෙස රාජකාරි භාර ගන්නා ලද අතර, එම අවස්ථාවට ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.

1971 වර්ෂයේ උපත ලද දේශබන්දු තෙන්නකෝන් මහතා කොළඹ නාලන්ද විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා අනතුරුව කොළඹ විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය හා කැළණිය

විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. 1998.02.23 දින සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස පොලිස් සේවයට එක්ව 2006 වර්ෂයේදී පොලිස් අධිකාරී තනතුරටද, 2011 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරටද, 2015 වර්ෂයේදී නියෝජ්‍ය පොලිස්පති තනතුරටද උසස්වීම් ලබා ඇත. වසර 26 කට ආසන්න සේවා අත්දැකීමක් ඇති ඒ මහතා ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රාදේශීය කොට්ඨාස රැසකද කොට්ඨාස භාර නිලධාරියෙකු ලෙස රාජකාරි ඉටු කර ඇත.

2006 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපදයේ ලුසියානා පොලිස් ඇකඩමියෙන් පශ්චාත් පිපුරුම් විමර්ශන පුහුණු පාඨමාලාව, 2008 වර්ෂයේදී දකුණු කොරියානු පොලිස් පරිපාලන පුහුණු පාඨමාලාව, 2016 වර්ෂයේදී චීනයේ යුනාන් පොලිස් ඇකඩමියේදී පවත්වන ලද ආසියානු මත්ද්‍රව්‍ය පිළිබඳව නීතිය ක්‍රියාත්මක කිරීමේ පුහුණු පාඨමාලාව හා 2019 වර්ෂයේදී නැගෙනහිර ටිමෝරයේදී පවත්වන ලද ප්‍රජා පොලිස්කරණය පිළිබඳ පුහුණු පාඨමාලාව ඇතුළු දේශීය, විදේශීය විවිධ පාඨමාලාවන්ද හදාරා ඇත. තවද 2011 වර්ෂයේ රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග්හිදී පැවති විශේෂ සේවා සහ නීතිය ක්‍රියාත්මක කරන සංවිධානවල ප්‍රධානීන්ගේ සමුළුව, 2013 වර්ෂයේදී ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවැත්වූ මිනිස් ජාවාරම් විරෝධී ඒකකවල අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා වන SAARC සාමාජික රටවල් සඳහා වූ වැඩමුළුව, එම වර්ෂයේදීම තායිලන්තයේ බැංකොක්හිදී පවත්වන ලද මත්ද්‍රව්‍ය පිටු දැකීම සඳහා වන ආසියා සහ පැසිෆික් කලාපයේ ප්‍රධානීන්ගේ සමුළුව ආදී විදේශීය සමුළු හා වැඩමුළු වලටද සහභාගී වී ඇත.

ඒ මහතා බස්නාහිර පළාත උතුර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති මෙන්ම අපරාධ බුද්ධි සහ ප්‍රජා පොලිස් දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ලෙස කටයුතු කරමින්, එම කාලසීමාව තුල ප්‍රජා පොලිස් සංකල්පය මත පදනම්ව අපරාධ නිවාරණය, මත්ද්‍රව්‍ය නිවාරණය, පාරිසරික සංරක්ෂණය සම්බන්ධව ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම කොළඹ නාගරික බල ප්‍රදේශය තුල රථවාහන ගමනාගමනය විධිමත් කිරීම වෙනුවෙන්ද විශේෂිත වූ සැළසුම් සකස් කරමින් ක්‍රියාත්මක කිරීම හා සංවිධානාත්මක අපරාධ ක්‍රියාකාරකම් මෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරම් මැඩලීම සඳහා නිලධාරීන් මෙහෙයවමින් අඛණ්ඩ මෙහෙයුම් ක්‍රියාත්මක කර අපරාධකරුවන් නීතිය හමුවට පැමිණවීමට කටයුතු කර ඇත.

එමෙන්ම මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් ඉන් මුදවා ගැනීම සඳහා ද සුවිශාල කාර්ය භාරයක් ඉටු කරන ලද අතර “යාත්‍රාව” සහ “සවිය” වැනි සංකල්පනාත්මක වැඩසටහන් තුළින් මත්ලෝලීන් ප්‍රජා පාදකව තම නිවස තුලදීම පුනරුත්ථාපනය කිරීම සඳහා සුවිශේෂී වූ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර මේ වනවිට 4000 කට ආසන්න මතට ඇබ්බැහි වූ පිරිසක් ඉන් මුදවා ගෙන සමාජ ගත කිරීමට කටයුතු කර ඇත.

2019 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරට පත්වන දේශබන්දු තෙන්නකෝන් මහතා, පුරා වසර 04 කට ආසන්න කාලයක් බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් කටයුතු කරමින් සිටියදී, 2023.11.30 වන අද දින පොලිස්පති ධූරයේ වැඩ බැලීමේ රාජකාරි භාර ගන්නා ලදී.

නිහිණ්ඩ නිහාල් තල්දූව,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,

පොලිස් මාධ්‍ය ප්‍රකාශක.